පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 06 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ..............................................................................

පාසලේ නම : ..............................................................................

ඇතුළත්වීමේ අංකය : ................................ කාලය : පැය 02 යි

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. කතන්දරයක් තුළ

i. චරිත දක්නට ලැබේ. ii. රංග විධාන දක්නට ලැබේ.
iii. පසුතල නිර්මාණ දක්නට ලැබේ. iv. ප්‍රේක්ෂකයින් දක්නට ලැබේ.

02. සත්ව චරිත නිරූපනයේ දී,

i. සාමුහිකවම චරිත නිරූපනය කළ යුතුය.
ii. විවිධ සත්ව චරිත අනුකරණය කළ යුතුය.
iii. සිවුපා සතුන්ගේ හැසිරීම් පමණක් නිරීක්ෂණය කළ යුතුය.
iv. මිනිස් චරිත හොඳින් අධ්‍යයනය කළ යුතුය.

03. නිර්මාණයක් සාර්ථක වීම සඳහා

i. පෙර තිබූ නිර්මාණයක් ඒ අයුරින්ම නැවත කළ යුතුය.
ii. තනිව හොර රහසේ නිර්මාණය කළ යුතුයි.
iii. පරිකල්පන ශක්තිය මෙහෙයවා කටයුතු කළ යුතුය.
iv. සතුටු අවසානයක්ම තිබිය යුතුයි.

04. ''කැත්තක් අරගෙන වත්තට යනකොට
පෙත්තෙක් ඉඳගෙන කජු කනවා''
මෙසේ කියමින් කරනු ලබන අභ්‍යාස වන්නේ,

i. සංවේදන අභ්‍යාස ii. මානසික අභ්‍යාස
iii. ශාරීරික අභ්‍යාස iv. කතන අභ්‍යාස

05. නියම ආකාරයෙන්ම අදහස් ප්‍රකාශ වන පරිදි සංවාද ඉදිරිපත් කිරීම මඟින්,

i. පිටපත රචනා කිරීමට පහසුවක් වෙයි. ii. සැමවිටම හාස්‍ය ඇති වෙයි.
iii. නාට්‍යයේ හාස්‍ය ඇති වෙයි iv. ආංගික අභිනය ප්‍රදර්ශනය වෙයි.

06. 'එලොව ගිහින් මෙලොව ආවා' නාට්‍යයට පාදක වුයේ,

i. උපමා කතාවකි. ii. ජාතක කතාවකි.

iii. සුරංගනා කතාවකි. iv. ජන කතාවකි

07. ''කොස්වතු කන්දේ කොස් කඩනා දා
වලගියදෝ මගේ මේවරයා''
මෙම කොටස ඇතුළත් ජන ක්‍රීඩාව වන්නේ,

i. මේවර කෙළිය ii. පනා හැංගීම

iii. ලේන්සු හැංගීම iv. එළුවන් කෑම

08. දෙඹ, පුස්,මදටිය භාවිතා කර,

i. රංගභාණ්ඩ සකස් කරයි ii. රංගාභරණ සකස් කරයි

iii. රංගවිධාන සකස් කරයි iv. රංගාලෝකය සකස් කරයි

09. පර කොළ, උණ කොළපු, ආධාරයෙන්,

i. සරල උපකරණ සකස් කරයි ii. සරල ආහාර සකස් කරයි

iii. සරල වෙස්මුහුණු සකස් කරයි iv. සරල ආභරණ සකස් කරයි

10. ''මම නිර්දෝෂියි, මට ජීවිත දානය දෙන්න'' ලෙස ඇතුළත් ජන කතාව වන්නේ,

i. බුදුන් වදින ලෙස වැදපන් අම්මාට ii. අනුන්ට කැපූ වලේ තමන් වැටීම

iii. හීල්බත් දංකුඩ iv. නාඩි බැලීම

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.
(ප්‍රේක්ෂකයින්/පැරණි ජනකතා/ භූමිකා රංගන/ පරිසරයෙන්/ නාට්‍ය පිටපතක්)

11. නාට්‍යයකදී .................................... උපයෝගී කොට ගෙන සාර්ථක නාට්‍ය නිර්මාණයක් බිහි කළ හැක.

12. ....................................... ලබා ගන්නා අත්දැකීම් නිර්මාණාත්මක පරිකල්පනය යොදා ගෙන රූපනයේ දී යොදා ගනී.

13. නාට්‍යයක් .................... වෙත ඉදිරිපත් කරන මාධ්‍ය අභිනය නමින් හඳුන්වයි.

14. නාට්‍යයකට .............................. මෙන්ම නාට්‍ය රචනයට කතා වස්තුවක් පාදක වේ.

15. ........................... නව අර්ථකථනයක් සහිතව වෙනස් කිරීම තුළින් තවත් රසවත් වේ.

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ගැලපෙන පිළිතුර යා කරන්න.

| | | |
|---|---|---|
| 16. | රංග විධාන/චරිත | ආහාර්ය අභිනය |
| 17. | සිරිත් විරිත්/ ඇඳුම්පැළඳුම් | රංගාභරණ |
| 18. | නිරෝගීබව/සාමූහිකත්වය | නාට්‍ය පිටපත |
| 19. | රංගවස්ත්‍ර/ රංගභාණ්ඩ | සංස්කෘතිකාංග |
| 20. | කල්පැවැත්ම/නිමාව | ජන ක්‍රීඩා |

(ලකුණු $02 \times 20 = 40$)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 ක පිළිතුරු සපයන්න.

01. i. 'පුංචි අපට දැන් තේරෙයි' නාට්‍ය පිටපතෙහි සඳහන් පුංචි අප යනු කවුරුන්ද?
ii. නාට්‍ය පිටපතට අදාළව ආරම්භයේ දී සත්ව කණ්ඩායමට නොමැති යැයි පවසන දේවල් 02 ක් ලියන්න.
iii. නාට්‍ය තුළදී සාදන ආහාර වර්ගය කුමක් ද?
iv. එම නාට්‍යයේ චරිත පිරිසේ එක් එක් අයට පාසලට කරගෙන යාමට තිබූ ක්‍රියාකාරකම් 02 ක් ලියන්න.
v. නාට්‍ය අවසානයේ දී 'පුංචි අපට' තේරුම් ගියේ කුමක් ද?
vi. ළමා නාට්‍යයක තිබිය යුතු ලක්ෂණ 02 ක් සඳහන් කරන්න.

(ලකුණු 2 x 6 = 12)

02. මහලු වී සිටියත්
රුවින් අඩු වී සිටියත්
දුප්පත්ව සිටියත්
දෙමව්පිය වැඳ පුදනු යහපත්

i. මෙම කවියෙන් කතන්දරයක් නිර්මාණය කරන්නේ නම් ඒ සඳහා යොදා ගත හැකි චරිත 02 ක් නම් කරන්න.

(ලකුණු 02)

ii. මෙම කවියේ දැක්වෙන පරිදි දෙමව්පියන් ලෙස මුහුණ දීමට සිදු වන තත්ත්වයන් සඳහන් කරන්න.

(ලකුණු 04)

iii. මෙම කවියේ තේරුමට ගැලපෙන කතන්දරයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු සිදුවීම් පෙළ ගස්වන්න.

(ලකුණු 06)

03. i. ඔබ දන්නා ජන ක්‍රීඩා 02 ක් ලියන්න. (ලකුණු 02)

ii. ජන ක්‍රීඩා ඇසුරින් නිර්මාණය වූ ගීතයක කොටසක් ලියන්න. (ලකුණු 04)

iii. ජන ක්‍රීඩා වල නිරත වීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියන්න. (ලකුණු 06)

04. i. රංගාභාරණ යනු මොනවාද? (ලකුණු 02)

ii. රංගාභාරණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් ලියන්න. (ලකුණු 04)

iii. ස්වාභාවික දෑ උපයෝගී කොට ගෙන රංගාභාරණයක් නිර්මාණය කරන ආකාරය රූප සටහනක් සහිතව පියවරෙන් පියවර විස්තර කරන්න. (ලකුණු 06)

05. i. පහසුවෙන් වෙස් මුහුණක් සාදා ගැනීමට අත්‍යාවශ්‍ය ද්‍රව්‍යන් 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. වෙස් මුහුණත් පැළඳ රඟ දක්වන නාට්‍යයක් නම් කර එහි චරිත සඳහන් කරන්න. (ලකුණු 04)

iii. වෙස් මුහුණක් නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් ලියන්න. (ලකුණු 06)

06. i. අනුකරණය යනු කුමක්ද? (ලකුණු 02)

ii. සතර අභිනය නම් කරන්න. (ලකුණු 04)

iii. නාට්‍යටක චරිත නිරූපණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් ලියන්න. (ලකුණු 06)

07. පහත සඳහන් පරිසර අත්දැකීම් පාදක කරගෙන නාට්‍යයක් රචනා කරන්න.

කැළයක අඹ ගසක් - අත්තක කූඩුවක් - කුරුළු පැටවුන් දොරට වඩින දවසක් - ගස යට කුඹසක් - ඉන් එළියට එන නාගයෙක් - කොළ කමින් සිටින අලියෙක්

(ලකුණු 12)

| | | |
|---|---|---|
| | **උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | |
| | **තුන්වන වාර පරීක්ෂය - 2023** | |
| **6 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංග කලාව** | **පිළිතුරු පත්‍රය** |

## I කොටස

01. I
02. II
03. III
04. IV
05. I
06. IV
07. I
08. II
09. III
10. II
11. භූමිකා රංගන
12. පරිසරයෙන්
13. ප්‍රේක්ෂකයින්
14. පිටපතක්
15. පැරණිකතා
16. නාට්‍ය පිටපත
17. සංස්කෘතිකාංග
18. ජනක්‍රීඩා
19. ආහාර්යක් අභිනය
20. රංගාභරණ

## I කොටස

01. I මී පැටවු
    II. ඉන්න තැනක්, යන්න තැනක්, කන්න තැනක්
    III. කැවුම්
    IV. සිතියමක් අඳින්න, ගෘහන් හදන්න, වයලීනය පුහුණුවීම
    V. මේ ලෝකේ කවුරු නමුත්
    වැඩපල නොකරනවානම්
    නිකම් ඔහේ පුටු පිට ඉඳ
    කන්ට හොඳ නෑ

    VI. සතුටු අවසානයක් /ළමුන්ට යහපත් ආදර්ශයක් ළමුන් මුල් වූ තේමාවක් /යහපත දිනවීමක්

02. i. සුදුසු පිළිතුරට ලකුණු ලබාදෙන්න.
    ii. මහලු විම/රුවින් අඩුවීම/දුප්පත් වීම
    iii. සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.

03. I. මේවර කෙලිය/ලේන්සු හැංගීම /පනා හැංගීම /එළුවන් කෑම/පොරපැන් ගැසීම/පංචදැම්ම
    II. තැනතැන රවුමට ඉඳගෙන
    ඉඳහිට එබිකම් කර කර ..............

    III.
    - සතුට විනෝදය
    - ක්‍රියාශීලිබව
    - ජය පැරදුම සමව විඳ දරා ගැනීම
    - නායකත්වයට ගරු කිරීම
    - එකමුතුකම

04. I. නාට්‍යයේ තේමාවට, ශෛලියට, චරිතයට ගැලපෙන පරිදි ආභරණ සැකසීම
II ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

05. I. කාඩ්බෝඩ්/කතුරු/ රබර් පටියක්/ වර්ණ
II. එලොව ගිහින් මෙලොව ආවා - අශ්වයා
III.
- පැලදීමට පහසුව
- රංගනයේ පහසුව
- සැහැල්ලු වීම

06. I. එක් අයෙක් කල ක්‍රියාවක් ඒ අයුරින්ම නැවත කිරීම
II.
- වාචික අභිනය
- ආංගික අභිනය
- සාත්වික අභිනය
- ආහාර්යය අභිනය

III.
- චරිතයේ ස්වභාවය
- නාට්‍යයේ ශෛලිය
- අනෙකුත් චරිතවල ක්‍රියාකාරීත්වය
- නාට්‍යයේ තේමාව
- චරිතයේ ක්‍රියාකාරීත්වය

07. සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පේර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න